Article 12(1)

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018.05.02

පැමිණිලිකරු : දොඹවලගේ ජූඩ් සීමන් ප්‍රනාන්දු මයා,
1020, අලුත්කුරුව,
පිටිපන, මීගමුව.

වගඋත්තරකරුවන් : 01. ලේකම්,
බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,
අංක 89, 4 වන මහල,
රත්මගපාය, බත්තරමුල්ල.

02. අධ්‍යක්ෂක,
පළාත් අධ්‍යාපන දෙපර්තමේන්තුව,
ආනන්ද කුමාරස්වාමි මාවත,
කොළඹ 07.

**<u>පැමිණිලි අංකය</u> : <u>HRC/2645/16</u>**

**පැමිණිල්ල තුලින් දක්වා ඇති කරුණු :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා මීගමුව කලාපයේ ශාන්ත අන්තෝනි විදුහලේ ගුරුවරයෙකු වශයෙන් සේවය කරමින් සිටියදී තමාට එරෙහිව චෝදනා පත්‍රයක් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සනින් යුතුව ලබා දුන් බවද ඊට අදාළ පරීක්ෂණයේදී සිදු කරන ලද සාධාරණ නොවූ ක්‍රියා පටිපාටිය තුලින් තම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවද වේ. තවද පෙත්සම්කරු දක්වා ඇත්තේ එකී විනය පරීක්ෂණයේදී චෝදනාවට සෘජුවම සම්බන්ධ වූ සාක්ෂිකරුවන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා නොදුන් බවද එහි චූදිත වූ මෙම පෙත්සම්කරුට සාක්ෂි ලබාදීමට අවස්ථාවක් ලබා නොදුන් බවද චූදිත පක්ෂයේ සාක්ෂිකරුවන්ට සාක්ෂි ලබාදීමට අවස්ථාවක් ලබා නොදුන් බවද ආයතන සංග්‍රහයේ 21.22 වගන්තිය අනුව විධිමත් විනය පරීක්ෂණයක් අවසානයේ සියළු පාර්ශවයන්ගේ සහභාගීත්වය තිබිය යුතු වුවත් එයද පැහැර හරිමින් පරීක්ෂණ නිලධාරිවරයා



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone } 94 -11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 011-2505575 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

හදිසියේම පරීක්ෂණය අවසන් කළ බවද වේ. එය ආයතන සංග්‍රහයේ ඇති නීතිරීති උල්ලංඝනය කිරීමක් මෙන්ම ස්වභාවික යුක්ති මූලධර්ම උල්ලංඝනය කරමින් තමාට අවිධිමත් හා අසාධාරණ ලෙස කරන ලද පරීක්ෂණයක් බවද, එකී පරීක්ෂණයෙන් තම සේවය අවසන් කර ඇති බවද සඳහන් කර ඇත. බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා විසින් තමාගේ අභියාචනයක් සලකා බලා අනිවාර්ය විශ්‍රාම ගැන්වීමක් ලබාදී ඇති අතර තමාට සිදුවූ නීතිවිරෝධී විනය පරීක්ෂණයේ ක්‍රියාපටිපාටිය හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් කඩවූ බවද නැවත සාධාරණ විධිමත් විනය පරීක්ෂණයක් ලබා දෙන ලෙසද පෙත්සම්කරු පෙත්සම තුළින් ඉල්ලා ඇත.

**වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම හා පරීක්ෂණයේදී අනාවරණය වී ඇති කරුණු:-**

2016.12.01 දිනැති පරීක්ෂණයේදීද පැමිණිලිකරු විසින් තම පැමිණිල්ලට අදාළ කරුණු දීර්ඝව ඉදිරිපත් කර ඇති අතර වගඋත්තරකරු වෙනුවෙන් පෙනී සිට ඇති පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන අංශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂක හේවගේ මියද පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නීති නිලධාරී ඒ.එස්. කුරේ යන අයද ඊට අදාළව වාචිකව කරුණු වාචිකව ඉදිරිපත් කරඇත. විශේෂ කරුණු දැක්වීමක් වගඋත්තරකරුවන් විසින් සිදු කර නොමැති අතර විධිමත් විනය පරීක්ෂණයේ පිටපතක් පමණක් ඉදිරිපත් කර ඇත. විධිමත් විනය පරීක්ෂණය පවත්වන ලද්දේ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව බැවින් වැඩිදුර කරුණු ඉන් ලබා ගන්නා ලෙස දක්වා ඇත. නැවත පරීක්ෂණයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට කැඳවා ගනිමින් සිදු කිරීමටද පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයට කැඳවා පරීක්ෂණයක් සිදු කිරීමට ද යටත්ව නැවත සිතාසි ඉදිරිපත් කර 2016.12.29 දින ඉදිරිපත් වන ලෙස දන්වා සිටි පසු එදින පරීක්ෂණයේදී ද වැඩිදුර කරුණු ඉදිරිපත් කිරීමක් සිදු කර නොමැති අතර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරිපත් නොවූ බැවින් නැවත ඒ සඳහා කැඳවීමක් සිදු කිරීමට තීරණය කර ඇත.

2017.01.16 දින සිතාසි ප්‍රකාරව කැඳවා තිබියදී රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරිපත් නොවූ බැවින් තවදුරටත් එම වගඋත්තරකරුට අවස්ථාවක් ලබාදීම සුදුසු බැවින් 2017.02.14 දින පෙනී සිටින ලෙස දන්වා ඇත. එකී සිතාසි අනුව පෙනී සිටීමට වෙනත් දිනයක් වගඋත්තරකරු ඉල්ලා සිටින බැවින් තවත් අවස්ථාවක් ලබාදෙමින් 2017.03.06 දින නැවත පෙනී සිටීමට දන්වා සිටි පසු බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් සුනිල් කුමාරසිරි මහතා ඉදිරිපත්ව සිටියද පෙත්සමට අදාළව කරුණු දැක්වීමට නියමිත ලිපි ගොනුව රැගෙන විත් නොමැති බවද නිරීක්ෂණය වී ඇත. ඒ අනුව නැවත අදාළ ගොනුව සමග ඉදිරිපත් වීමට ඉල්ලා සිටියද පෙත්සම්කරු දන්වා ඇත්තේ අවස්ථා ගණනාවක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව කරුණු ඉදිරිපත් කිරීම මග හැර සිටින බැවින් අවසන් නිර්දේශයක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින බවයි.

**නිරීක්ෂණ :-**

පෙත්සම්කරු ඉදිරිපත් කර ඇති කරුණු හා විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වූ බවට වගඋත්තරකරුවන් කොමිෂන් සභාවට ලබාදී ඇති වාර්තාව අනුව මානව හිමිකම් කොමිෂන් සභාව කරුණු සලකා බලා ඇත. ඒ අනුව පැමිණිල්ලට සම්බන්ධයෙන් නිසි පරිදි කරුණු දැක්වීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අවස්ථා හතරකදී ඉදිරිපත් නොවීම පෙත්සමේ කරුණු තහවුරු කර ගැනීමට සහාය ලබා නොදුන් අවස්ථාවක් ලෙස නිරීක්ෂණය කරනු ලබන අතර, ඉන් පැමිණිලිකරුට තවදුරටත් අසාධාරණයක් සිදුවූ බව පෙන්වා දියයුතු වේ. පැමිණිලිකරුට එරෙහිව විනය පරීක්ෂණය පවත්වා ඇත්තේ පහත සඳහන් පරිදි පැමිණිලිකරුට අගතියක් වන පරිදි බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

1. විනය බලධාරියාගේ ආවරණ අනුමැතියක් ලබා ගනිමින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් මූලික විමර්ශනය පැවැත්වීම ආයතන සංග්‍රහයේ 40 වන පරිච්ඡේදයේ 6.2 වගන්තිය උල්ලංඝනය කිරීමක් බව නිරීක්ෂණය වේ.

2. එසේම විධිමත් විනය පරීක්ෂණය පවත්වාගෙන යාමේදී විනය බලධාරියා විසින් නිකුත් කළ සංශෝධිත චෝදනා පත්‍රය චූදිත හට කියවා දී වරදකරුද නිවැරදිකරුද යන්න නොවිමසීමද සාක්ෂි සටහන් කිරීමේදී පරීක්ෂණ වාර්තාවේ හිස්තැන් තබා යතුරුලියනය කිරීමද,

3. විධිමත් විනය පරීක්ෂණයේදී සාක්ෂිකාරයින්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට ඉඩ ලබාදී නොතිබීමද,

4. චූදිත හට සාක්ෂිදීමට හෝ විත්තියේ සාක්ෂි කැඳවීමට ඉඩ ලබා නොදීමද,

5. චෝදනාවට සෘජුවම සම්බන්ධ සාක්ෂිකාරයන්ගෙන් හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා නොදීමද සිදුව ඇති බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

6. තවද විනය පරීක්ෂණය අවසානයේ සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වය තිබිය යුතු බවට ඇති ආයතන සංග්‍රහයේ 21.22 වගන්තිය උල්ලංඝනය කිරීමද සිදුව ඇති බව කොමිෂන් සභාවේ නිරීක්ෂණයට ලක්ව ඇත.

එසේම පැමිණිලිකරුගේ ආවරණ නිලධාරි ලෙස ඉදිරිපත් වූ මහගමගේ ධර්මදාස මහතාද දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් දක්වා ඇත්තේ, විනය බලධාරියා විසින් චූදිත නිලධාරියා හට මීගමුව දිසා අධිකරණයේ පවරා තිබූ නඩුවක් හේතුවෙන් ද්වේශසහගත පදනමක් මත චෝදනා පත්‍රය නිකුත් කර ඇති බවද විනය පරීක්ෂණය පවත්වන ලද්දේ ආයතන සංග්‍රහයට පටහැනිව බව දිවුරා ප්‍රකාශ කරන බවද වේ. තවද ආවරණ නිලධාරි ධර්මදාස මහතා අසනීප වූ පසු ඒ වෙනුවෙන් ඉදිරිපත් වූ බෙනිපිලිප්ස් නම් ආවරණ නිලධාරි මහතා විසින්ද දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිත් කරමින් විනය පරීක්ෂණය පවත්වන ලද්දේ ඒකපාර්ශවීය සහ හරස් ප්‍රශ්න ඇසීමට අවස්ථාවක් ලබා නොදීමෙන්

බවද ආයතන සංග්‍රහයේ නීතිරීති උල්ලංඝනය කරමින් එය සිදු කළ බවද ප්‍රකාශ කොට ඇත. 02 වන දිවුරුම් ප්‍රකාශය තුළ ඇති කරුණු ද සැලකිල්ලට ගැනීමේදී පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයකට වගඋත්තරකරුවන් කටයුතු කරමින් විනය පරීක්ෂණයකදී සලකා බැලිය යුතු ස්වභාවික යුක්ති මූලධර්ම උල්ලංඝනය කර ඇති බව නිරීක්ෂණය වේ. වගඋත්තරකරුවන් පෙත්සම්කරුට නිසි ලෙස සවන් දී නොමැති බව පෙනී යන අතර ද්වේශසහගත චේතනාවකින් යුතුව ආයතන සංග්‍රහයේ නීතිරීති උල්ලංඝනය කරමින් වාර්තාවක් සකස් කර එය විධිමත් විනය පරීක්ෂණයක් බවට දක්වා පැමිණිලිකරුගේ රැකියාව අහිමි කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

ඒ අනුව පැමිණිලිකරුට වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති නීතියේ සර්ව සාධාරණත්වය හා සමානාත්මතාවයේ අයිතිය පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව විධිමත් නොවූ පරීක්ෂණ වාර්තාවක් පදනම් කර ගනිමින් පැමිණිලිකරුගේ සේවය අවසන් කර තිබීම නීත්‍යානුකූල නොවන බැවින් පැමිණිලිකරු නැවත සේවයේ පිහිටුවා ඔහුට හිමි හිඟ වැටුප්ද අඛණ්ඩ සේවයද වෙනත් හිමිවිය යුතුව තිබූ වරප්‍රසාදද ලබාදීමට කටයුතු කළ යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2018.6.2 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.

B/R-5